


# පොකුණේ ආගන්තුකයා

T.M.K. සිතුමිණී බණ්ඩාර

5 - D

කතෘගේ නම - T.M.K. සිතුම්ණි බණ්ඩාර (5 – D)

කතෘගේ වෙනත් කෘති

- ❖ ලෝකාන්ත චාරිකාව
- ❖ සරුංගලය

කෘතිය පල කරන දිනය - 2025 පෙබරවාරි 08

ISBN අංකය - 978-624-208-356-8

පිදුම

ආදරණීය

මහාමායා

මාතාවට

සෙනෙහසින් !

## පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනිමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතිත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.


මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දිමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

මගේ අයියාගේ නම නදුන් හසරැල්. අයියා ඉගෙන ගන්නේ 8 ශ්‍රේණියේ. අයියාගේ සුරතලුන් තමයි බල්ලයි, පූසයි. අයියා තමයි ඒ දෙන්නට කෑම දීලා, නාවලා බලාගන්නේ. අයියා සත්තුන්ට හරි ම ආදරෙයි. මමත් සත්තුන්ට ආදරෙයි.



දවසක් අයියාගෙන් කරදරේ අප්පච්චිට මාළු ටැංකියක් ඕනි කියලා. "පුතේ මාළු ටැංකියකට වඩා හොඳයි පොකුණක්. අපි අපේ මිදුලේ පොකුණක් හදමු." අප්පච්චි කිව්වා. ඉතින් සෙනසුරාදා දවසක අපි හැමෝම එකතු වෙලා අපේ මිදුලේ පොකුණක් හැදුවා.



අයියාට වගේම මටත් සතුටුයි. අපේ මිදුලේ ලස්සන පොකුණක්. අප්පච්චි ලස්සන මාළුවෝ හය දෙනෙක් පොකුණට ගෙනැත් දැම්මා. පාට පාට මාළුවෝ උන් එහාට පීනනවා මෙහාට පීනනවා. අයියා ඉස්කෝලේ යන්න කලින් මාළුන්ට කෑම දාලයි යන්නේ.



අපි ඉස්කෝලේ ගියාම පොකුණ බලාගන්නේ අපේ
අත්තම්මා. දවසක් අපි ඉස්කෝලේ ගිහින් එනකොට
"අනේ පුතේ අද අපේ පොකුණ ළඟ වැටට
පිළිහුඩුවෙක් ආවා. මම මිදුලේ හිටිය හින්දා හොඳයි
නැත්තම් මාළුවෝ ටික කනවා. උන් තාම පොඩියිනේ
පොකුණට දැලක් දාන්න වෙයි." අත්තම්මා කිවුවා.



ඉතින් අපි අප්පච්චිට කියලා එදා හවසම දැලක් ගෙනත් දැම්මා. දැල පොකුණ උඩ තියලා වටේට ගල් තිබ්බා. දැන් මාළුවෝ ගැන බය වෙන්න එපා උන් ආරක්ෂිතයි. අප්පච්චි වගේ ම අත්තම්මා ත් කිව්වා.



තව දවසක් අත්තම්මා මිදුලේ ඉන්නකොට පොකුණ ඇතුලේ සද්දයක් ඇහිලා. මාළුවෝ දඟලනවාලු. උන් උඩ පනිනවාලු. අත්තම්මා පොකුණ ළඟට යනකොට දියබරියෙක් පොකුණේ ඉඳලා. අත්තම්මා ඌව එළවලා.



සෙනසුරාදා දවසේ තමයි අපි පොකුණ පිරිසිදු කරන්නේ. අනේ! එදා පොකුණ පිරිසිදු කරනකොට මාළුවෝ දෙන්නෙක් නෑ. "අනේ උන්ව දියබරියා කන්න ඇති." අයියා කිවුවා. අයියාට හරිම දුකයි.ඒ නිසා අපි පොකුණ වටේට ගල් තියලා දැල තවත් හොඳින් රැදෙවුවා.



දවසක් අත්තම්මා මිදුල අතුගානකොට පොකුණේ දැල උඩ මොකෙක්ද දගලනවාලු. අනේ ළඟට යනකොට දියබරියා මාළුවෙක් ගෙන්යන්න උඩටම අරන්. මාළුවෝ දැන් ටිකක් ලොකු නිසා ඌට මාළුවා කන්නත් බෑ. ගෙනියන්නත් බෑ. අත්තම්මා ගියපු සද්දෙට ඌ මාළුවා අතෑරලා යන්න ගිහින්. ඒත් ඒ මාළුවා මැරිලා.



දැන් පොකුණේ මාළුවෝ තුන් දෙනයි. අයියයි මායි මිදුලේ ඉන්නකොට දියබරියා පොකුණ ඇතුළේ දගලනවා. ඒත් මාළුවෝ කන්නත් බෑ. අල්ලන්නත් බෑ. උන් ලොකුයිනේ. අපි යන සද්දෙට දියබරියා පොකුණෙන් අහකට ඇදිලා ගියා.



ඊළඟ දවසේ අප්පච්චි දියබරියාට යන්න බැරි වෙන්න චූටි දැලක් පොකුණට ගෙනත් දැම්මා. දැන් නම් දියබරියාට එන්න බෑ. අප්පච්චි තව මාළුවෝ තුන් දෙනෙකුත් අයියට ගෙනත් දුන්නා. "සුරතල් සත්තු ඇති කරනවා වගේ නෙවෙයි උන්ව හොදට පරිස්සමට බලා ගන්නත් ඕනි." අප්පච්චි කිවුවා.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්